# කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී ගොවිතැන හා සම්බන්ධ ව්‍යවහාරික දේශීය දැනුම පිළිබඳ අධ්‍යයනයක් මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

## ටී.එම්.ඒ.එන්. ජයතිලක[1]

**සංක්ෂේපය**

වර්තමානය වන විට සමාජය තුළ අවධානයට පාත්‍ර වී ඇති ක්ෂේත්‍රයක් වශයෙන් දේශීය දැනුම හඳුන්වා දිය හැකිය. යම් කිසි ප්‍රදේශයකට හෝ පුද්ගල කණ්ඩායමකට අනන්‍ය වූ පාරම්පරිකව මුඛ වහර ඔස්සේ සම්ප්‍රේෂණය වන ගැමි ජනතාවගේ පාරිසරික සහයෝගීතාවය හා අව්‍යාජත්වය නිරූපනය කරන ක්ෂේත්‍රයක් ලෙස මේ දේශීය දැනුම යන්න හඳුනා ගත හැකි ය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් සිදු කරන ලද මේ අධ්‍යයනයේ අරමුණු වන්නේ එම ප්‍රදේශයට ආවේනික දේශීය දැනුම භාවිත වන විවිධ ක්ෂේත්‍රයන් එනම් වී ගොවිතැන, කම්මල් කර්මාන්තය, දේශීය වෛද්‍ය ශාස්ත්‍රය, කුඹල් කර්මාන්තය, හා කොහු කර්මාන්තය යනාදී කර්මාන්තයන් හඳුනා ගැනීමයි. එමෙන්ම වී ගොවිතැන හා සම්බන්ධව ප්‍රදේශයට අනන්‍ය වූ පාරම්පරික ඥානය රැස් කර ලේඛනගත කිරීම මේ අධ්‍යයනයේ මූලික අරමුණ වේ.

අධ්‍යයනයේ නියැදිය ලෙස මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ග්‍රාම නිළධාරී වසම් 33 න් සසම්භාවී ලෙස ග්‍රාම නිළධාරී වසම් 04 ක් තෝරා ගත් අතර එම වසම් 04 හි පිහිටි ග්‍රාමයන්හි ස්ථිර පදිංචි ගොවි මහත්ම මහත්මීන් සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා මෙන්ම නිරීක්ෂණ මඟින් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදි. ද්විතීය දත්ත වශයෙන් ග්‍රන්ථ, උපාධි නිබන්ධන, විශ්වකෝෂ හා පර්යේෂණ වාර්තා ආදී මූලාශ්‍ර භාවිත කරන ලදී.

දත්ත විශ්ලේෂණය තුළින් එළඹිය හැකි නිගමනය වූයේ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන යැපුම් මාර්ගය බවට වී ගොවිතැන පත්ව ඇති ආකාරය යි. ඒ ආශ්‍රිත පාරම්පරික දැනුම තවමත් සුරැකිව පවතින අතර ඒවායෙහි භාවිතය අවම මට්ටමක පවතින බවය. ප්‍රදේශයේ වැඩිහිටි පරම්පරාව විසින් අදටත් වී වගාවේ ආරක්ෂාව සඳහා යම් යම් සිරිත් විරිත්, පුද පූජා හා කෙම් ක්‍රම අනුගමනය කරන ආකාරය පැහැදිළි විය. නමුත් නවීන තාක්ෂණික දියුණුව හේතු කොට ගෙන උත්පාදනය වන නව නිෂ්පාදනයන් හේතු කොට ගෙන අතිශයින් කාර්යබහුල වත්මන් පරපුර ඒවා භාවිතයට පෙළඹීම තුළ අතීතයේ සිට මේ ප්‍රදේශය හා බැඳී පැවතුන පාරම්පරිකව විකාශනය වූ යම් යම් දේශීය දැනුම් සම්ප්‍රදායන් වැඩිහිටි පරපුරේ අභාවයත් සමඟම විනාශ මුඛයට ඇද වැටෙමින් පවතින බව පැහැදිළි විය.

**ප්‍රමුඛ පද: දේශීය දැනුම, වී ගොවිතැන, පාරම්පරික දැනුම, කුරුණෑගල දිස්ත්‍රික්කය**

---

1. *පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* anushajayathilaka863@yahoo.com